1 (අ) විද්‍යාඥයාගේ හා විධික්‍රම වාදියාගේ කාර්යභාර්ය කෙබඳු වේද?

(ආ) උද්ගමනවාදී විධික්‍රමය හඳුන්වා විද්‍යාත්මක ගවේෂණය උදෙසා එය කෙතරම් දුරට යෝග්‍යවේ දැයි විවේචනය කරන්න.

(2) (අ) පහත සඳහන් තර්ක සුදුසු සංක්ෂේපණ රටාවක් අනුව සංකේතකර එහි ඇගයුම් චක්‍ර සත්‍ය චක්‍ර ක්‍රමයෙන් තීරණය කරන්න.

(1) ගිරවුන් කොළ පාට හෝ මයිනන් කළු පාට හෝ වෙයි. ඉදින් මයිනන් කළුපාට වේ නම් එවිට මයිනන් කොළ පාට නොවේ. එහෙයින් එක්කෝ ගිරවුන් කොළ පාටය. නැත්නම් මයිනන් කොළ පාට නොවේ.

(2) සර්පයා කිපෙන විට දෂ්ඨ කරයි. උන් දෂ්ට කරයි නම් මිනිස් ජීවිත අවදනම් වේ. සර්පයා දෂ්ඨ කරන්නේ කිපෙන විට පමණි. එහෙයින් "උන් කිපෙන්නේ නැත්නම් මිනිස් ජීවිත අවදනම් නොවේ.

(3) ඔහු විභාගයෙන් සමත් වීශ්වවිද්‍යාලයට ඇතුල් වන්නේ නම එවිට එක්කෝ නේවාසික ශාලාවක නැත්නම් මිතුරෙකුගේ නිවසක නතර වේ. ඔහු මිතුරෙකුගේ නිවසක නතර වන්නේ නැත. එහෙයින් ඔහු විභාගය සමත් වන්නේ නම් විශ්ව විද්‍යාලයට ඇතුළු වන අතර නේවාසික ශාලාවක නතර වෙයි.